# 02 පාඩම ව්‍යාපාර සමාජ වගකීම හා ආචාරධර්ම



## පිළිගත් නිර්වචන ඇසුරෙන් ව්‍යාපාර සමාජයීය වගකීම හැඳින්වීම

ව්‍යාපාරයක සමාජ වගකීම් සංකල්ප පිළිබඳ විවිධ නිර්වචන ඉදිරිපත් වී ඇත .

1. සමස්ත සමාජයේ සහ ප්‍රදේශයේ ජනතාවගේ සේවකයින් ගේ හා ඔවුන්ගේ පවුල්වලත් , ජීවන තත්ත්වය නංවාලීමට සහ රටේ ආර්ථික සංවර්ධනයට දායක වන බවට හා සදාචාරාත්මකව හැසිරෙන බවට ව්‍යාපාර අඛණ්ඩව කැපවීම ව්‍යාපාර සමාජ වගකීමයි.

තිරසර සංවර්ධනය පිළිබඳ ලෝක ව්‍යාපාර සභාව

2. සමාජය තුළ ධනාත්මක බලපෑමක් ජනිත කිරීමට ව්‍යාපාර ක්‍රියාවලිය කළමනාකරණය කරන්නේ කෙසේද යන්න පිළිබඳ වූ අදහස ව්‍යාපාර සමාජ වගකීමයි.

මාලන් බේකර්

3. ගනුදෙනුකරුවන් , සේවකයින් ,සමාජය, රජය හා පරිසරය ආදී සියලුම උනන්දුවක් දක්වන පාර්ශවයන්ට සාධාරණ ලෙස කටයුතු කරමින් කොටස් හිමියන්ට උපරිම අගයක් බිහිකර දීම ව්‍යාපාර සමාජ වගකීම වේ.

නාරායන් මූර්ති

ව්‍යාපාර සමාජ වගකීම පිළිබඳව විවිධ රටවල් විසින්ද නිර්වචන ඉදිරිපත් කර ඇත.

"සිය ව්‍යාපාර ක්‍රියාකාරකම් පිළිබඳ වත් එමගින් සමාජයට ඇති වන බලපෑම පිළිබඳවත් පෞද්ගලිකවම ව්‍යාපාර වගකීම " සමාජ වගකීමයි.

ඇමරිකා එක්සත් ජනපදය

"ව්‍යාපාර සමාජයට ආපසු දෙන දෑ" සමාජ වගකීමයි.

පිලිපීනය

## ව්‍යාපාර විසින් සමාජයීය වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම.

- ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාව පිළිබඳ දැඩි අවධානයක් වර්තමානය වර්ධනය වී ඇත.
- ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශවයන්ට හා පොදුවේ සමාජයට බලපෑම් ඇති කරන බලවේග කිහිපයක් වර්ධනය වෙමින් පවතී .

1. තරඟය

- සාධාරණ නොවන මිල , ව්‍යාපාර සදාචාරය පිරිහීම, අනවශ්‍ය පරිභෝජනය නැඹුරුව , මාධ්‍ය අහිතකර ලෙස භාවිතය , නිත්‍යානුකූල නොවන ව්‍යාපාර බිහිවීම .

2. ගෝලීයකරණය

- සංස්කෘතියට ඇතිවන බාධා ඉහළ යාම

3. විද්‍යුත් ව්‍යාපාර

- ව්‍යාපාරික වංචා වර්ධනය ඇති ඉඩකඩ පුළුල්වීම.

4. පරිසර දූෂණය

- ස්වාභාවික ආපදා , දේශගුණික විපර්යාස වර්ධනය වීම

මෙම අංශවල ව්‍යාප්තිය සමග සිදුවන ව්‍යාපාර ක්‍රියාකාරකම් මගින් සමාජයට හා ව්‍යාපාර කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශව වලට අහිතකර බලපෑම් එල්ල කර ඇත. මෙම තත්වයන් වළක්වාලීම සඳහා සමාජ වගකීම් ඉටු කිරීමේ අවශ්‍යතාවය ඉස්මතු වී ඇත.

වර්තමාන සමාජය තුළ සමාජ වගකීම් වැදගත් වීමට හේතු

1. පරිසර දූෂණය ඉහළ යාම නිසා පරිසරය ආරක්ෂා කිරීම අවශ්‍ය වීම.

2. වංචා දූෂණ අවම කිරීම හා වැළැක්වීමට

3. සමාජය තුළ ආචාර ධර්ම පිරිහීම නිසා ආචාර ආචාරධර්ම ප්‍රවර්ධනයට

4. සම්පත් හිඟවීම නිසා කාර්යක්ෂම ලෙස සම්පත් භාවිතයට

5. දිළිඳුකම හා කුසගින්න අවම කර සමාජ සාධාරණය ඇති කිරීම.

## ව්‍යාපාර වලින් සමාජීය වගකීම් ඉටු විය යුතු පාර්ශව ලැයිස්තුගත කිරීම.

ව්‍යාපාරවල සමාජ වගකීම් ඉටු විය යුතු ප්‍රධාන පාර්ශව කිහිපයකි

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- අයිතිකරුවන්
- සමාජය
- රජය
- ප්‍රජාව
- පරිසරය

ව්‍යාපාරයක් විසින් එක් එක් පාර්ශවය වෙත ඉටුකළ යුතු සමාජ වගකීම් වෙන වෙනම නිදසුන් සහිතව ඉදිරිපත් කිරීම.

එකෙක් පාර්ශවය වෙත ව්‍යාපාර විසින් ඉටු කළ යුතු සමාජ වගකීම් වෙන් වෙන් වශයෙන් ඉදිරිපත් කළ හැකිය.

ගනුදෙනුකරුවන්/ පාරිභෝගිකයින්

- සාධාරණ වීම
- හානි අවම කිරීම / පාරිභෝගිකයා ආරක්ෂා කිරීම
- පාරිභෝගික අයිතිවාසිකම් ආරක්ෂා කිරීම
- ඉහළ ගුණාත්වයෙන් යුතු නිෂ්පාදන සැපයීම
- ආරක්ෂිත නිෂ්පාදිත සැපයිම
- සාධාරණ මිලකට නිෂ්පාදිත සැපයීම
- රජය සම්මත කර ඇති පාරිභෝගික අණ පනත් හා රෙගුලාසි සුරැකීම
- ගනුදෙනුකරුවන්ට අවශ්‍ය විවිධ පහසුකම් සැලසීම
- භාණ්ඩ පිළිබඳව පාරිභෝගිකයා දැනගත යුතු තොරතුරු නිවැරදිව හා නොසඟවා සැපයීම.

සේවකයින්

- සමානාත්මතාවය තහවුරු කිරීම
- මනා සේවක සම්බන්ධතා ගොඩනැගීම

- වෘත්තීය ආරක්ෂාව සැපයීම
- සෞඛ්‍ය පහසුකම් සැපයීම
- සේවක සුභසාධනය
- කම්කරු අයිතීන් සුරැකීම
- සේවකයින්ගේ ගරුත්වය රැකෙන පරිදි කටයුතු කිරීම
- කම්කරු නීති රීති සුරැකීම
- සේවකයින්ට සාධාරණ වැටුපක් ගෙවීම
- මනා වැඩ පරිසරය
- අධ්‍යාපනය හා පුහුණුව
- සේවක අභිප්‍රේරණය

අයිතිකරුවන්

- සාධාරණ ඉපයුම් ලබාදීම
- ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම
- කාර්යක්ෂමව හා අවංක ලෙස කළමනාකරණ කටයුතු මෙහයවීම.
- විනිවිදභාවයකින් / පාරදෘශ්‍යභාවයකින් යුක්තව කළමනාකරණ කටයුතු සිදුකිරීම
- අයිතිකරුවා යොදන ලද ප්‍රාග්ධනය ආරක්ෂා කිරීම
- මූල්‍ය වගවීම ඇති කිරීම

සමාජය

- රැකියා නියුක්තිය ට දායක වීම
- බදු ගෙවීම නොපිරිහෙලා ඉටු කිරීම
- අපද්‍රව්‍ය කළමනාකරණය
- ප්‍රජා සත්කාර සේවා
- හරිත නිෂ්පාදන කරා යොමු වීම
- පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම

- පුන්‍ය ආයතන නඩත්තු කිරීම
- ජනතා අධ්‍යාපනයට සහය දීම
- ආර්ථික හා සමාජ සංවර්ධනයට දායක වීම
- මානව හිමිකම් සුරැකීම
- අවම බාධා සිදු වන පරිදි ව්‍යාපාර කටයුතු කිරීම

## සියලුම පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජයීය වගකීම් ඉටුකළ හැකි ආකාරය පැහැදිලි කිරීම

සියලුම පාර්ශවයන්ගේ අපේක්ෂා ඉටු වන ආකාරයට සමාජ වගකීම් ඉටු කිරීමට පෙළඹිය යුතුය.

■ ගනුදෙනුකරුවන්ට සමාජයීය වගකීම් ඉටු කිරීමේ දී එනම් හානි අවම වන ගුණාත්මක භාණ්ඩයක් හෝ සේවාවක් සාධාරණ මිලට ලබා දීමේදී සේවකයින්ට ඔවුන්ගේ වෘත්තිය අයිතිවාසිකම් හා අනෙකුත් පහසුකම් ලබාදීම , අයිතිකරුවන්ට ප්‍රමාණවත් ආර්ථික ප්‍රතිලාභ අත්කර දීම, මෙන්ම සමාජයට පරිසර හිතකාමී ලෙස කටයුතු කිරීම මගින් අනෙකුත් පාර්ශ්ව වෙත ද අවාසිදායක තත්ත්වයක් ඇති නොකර සෑම පාර්ශවයකම අපේක්ෂා ඉටු කළ යුතුය.

■ අයිතිකරුවන්ගේ සමාජ වගකීම ආරක්ෂා කිරීමේ දී එනම් ඔවුන්ට සාධාරණ ඉපයීමක් ලාභයක් අත්කර දීමේදී අනිකුත් පාර්ශ්වවල එනම් ගනුදෙනුකරුවන්ට සාධාරණ මිලට භාණ්ඩ ලබාදීම ,සමාජයට ප්‍රජා සත්කාර සේවා ලබාදීම ද, සේවකයින්ගේ වෘත්තීය අයිතිවාසිකම් ආරක්ෂා කිරීම හා අනෙකුත් පහසුකම් සැලසීම ද මගින් ඒ ඒ පාර්ශවයේ සමාජීය වගකීම් ආරක්ෂා කළ යුතුයි .

සමාජීය වගකීම් ඉටු කිරීමෙන් ව්‍යාපාරයකට හිමිවන ප්‍රතිලාභ ලයිස්තුගත කිරීම

- ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වේ
- ව්‍යාපාරයේ ප්‍රතිරූපය කීර්තිනාමය වර්ධනය වේ
- ව්‍යාපාරය පිළිබඳ විශ්වාසනීයත්වය තහවුරු වෙයි
- ගනුදෙනුකරුවන් තෘප්තිමත් කළ හැකි වීම
- ව්‍යාපාරයේ පරමාර්ථ හා අරමුණු කරා ළඟා වීම පහසු වීම
- සේවක ආකර්ෂණය වැඩි කර ගැනීමට හැකි වීම
- ලාභය වැඩි වීම
- ආයෝජකයන්ගේ ආකර්ෂණය වැඩි වීම
- විරුද්ධවාදීන් අඩුවීම

- තරඟකාරීත්වය පහසුවීම
- රාජ්‍ය අනුග්‍රහය ලැබීම
- නීතිමය බලපෑම් අවම වීම

පරිසර හිතකාමී ලෙස කටයුතු කරමින් තිරසර සංවර්ධනට ව්‍යාපාර දායක වන ආකාරය ඇගයීම

- සියලුම වෘක්ෂලතාවෝ කපා දැමූ පසු
- සියලුම ගංගා සිඳී ගිය පසු
- අන්තිම මාළුවා ද අල්ලා ආහාරයට ගත් පසු
- මිනිසා තේරුම් ගනීවි මුදල් ආහාරයට ගත නොහැකි බව

ආදී රතු ඉන්දියානු ගෝත්‍රික වැකියකි

මිනිස් අවශ්‍යතා හා වුවමනා සපුරා ගැනීම හා පරිසරය සම්බන්ධ ඉහත ප්‍රකාශය පිළිබඳ ඔබගේ අදහස් දක්වන්න.

..........................................................................................................................................................

..........................................................................................................................................................

..........................................................................................................................................................

.............................................................................................................................

තිරසර සංවර්ධන යන්න පැහැදිලි කිරීම

තිරසර සංවර්ධනය යනු

..........................................................................................................................................................

.................................................................................................................'

පරිසරය හා සංවර්ධනය සඳහා වූ ලෝක කොමිෂන් සභාව

"අනාගත පරම්පරාවල මිනිස් අවශ්‍යතා සපුරා ගැනීම සහතික වන පරිදි තාක්ෂණික හා ආයතනික යොමුවක් ඇතිව ස්වභාවික සම්පත් කළමනාකරණය හා සංරක්ෂණය කිරීමයි. එවැනි තිරසර සංවර්ධනයක් මඟින් භූමිය ජලය මෙන්ම සත්ව හා ශාක ඇතුළත් ඓන්ද්‍රිය සම්පත් පාරිසරික වශයෙන් හායනය නොවන පරිදි තාක්ෂණික වශයෙන් ගැලපෙන පරිදි හා ආර්ථික හා සමාජයීය වශයෙන් පැවතිය හැකි පරිදි සංරක්ෂණය කළ යුතු වේ. "

ලෝක ආහාර හා කෘෂිකාර්මික ආයතනය

"මානවයාගේ සුභ සාධන මට්ටම් පහත  නොබසින ලෙස පවත්වාගෙන යන හා ඒ මඟින් එහි ප්‍රගතියක් ඇති කරවන තත්ත්වයක් තිරසර සංවර්ධනයක් යන්නෙන් හැ න අතර තිරසර සංවර්ධනයට සමාන තත්ත්වයක් වනුයේ කාලයාගේ ඇවෑමෙන් එම සුභසාධනය පහත නොබැසීමේ අවශ්‍යතාවයයි."

ඩේවිඩ් පියර්ස්

"සම්පත් පදනමේ ස්ථාවරත්වය හා අනාගත පරපුරෙහි ප්‍රතිලාභ සඳහා පරිසරය ආරක්ෂා කරමින් සමාජයීය වශයෙන් වගකීමෙන් යුත් ආර්ථික සංවර්ධනය සහතික කිරීම තිරසර සංවර්ධනයයි "

පරිසරය හා තිරසර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ සම්මේලනය

තිරසර සංවර්ධනයේ මූලිකාංග

තිරසර සංවර්ධනය ගොඩනැගී ඇත්තේ සමාන වැදගත් වැදගත්කමක් ඇති කුළුණු තුනක් මතය. ඒවා නම් ,

1. ආර්ථික තිරසර සංවර්ධනය ( economic sustainable development )

ආර්ථික වර්ධනය හා සමගාමීව ජනයාගේ ජීවන තත්ත්වය උසස් මට්ටමකට ගෙන ඒමයි. එනම් ආර්ථික සංවර්ධනයේදී සම්පත් පරිභෝජනය අඩු කර ජීවන තත්ත්වය උසස් කිරීම මගින් මානව සුභසාධනය සැලසීමයි. සැමදෙනාටම දැරිය හැකි මිලකට පරිසර හිතකාමී නිෂ්පාදන බිහි කිරීම තුළින් පිරිසර ආර්ථික සංවර්ධනයක් ලබා ගැනීම මින් අපේක්ෂා කෙරේ .

2. පරිසර තිරසර ආරක්ෂණය ( envioramemt sustainable protection )

මිනිසා හා පරිසරය අතර පවත්නා මනා සම්බන්ධතාව පවත්වාගෙන යාමයි. එනම් වාතය ජලය පස යනාදිය ආරක්ෂා කර කරගනිමින් මූලික මිනිස් අවශ්‍යතා සපුරා ගැනීමයි. ස්වභාවික පරිසරය නොනසා හා අනාගත පරපුර වෙනුවෙන් එය ආරක්ෂා කරමින් මානව ක්‍රියාකාරකම් වල යෙදීමයි.

3. සමාජ තිරසර සංවර්ධනය ( social sustainable development )

සමානාත්මතාවයෙන් යුතු ජනතාවක් බිහි කිරීමයි. එනම් මිනිස් අවශ්‍යතා හා වුවමනා ඉහළ ප්‍රමිතියකින් යුතුව ළඟාකර ගැනීමේදී අන් අයගේ එම අයිතිය දෝෂ කිරීම හෝ උල්ලංඝනය කිරීම සිදු නොකිරීම.

## තිරසර සංවර්ධන සංකල්පය

ව්‍යාපාරයකට තිරසර සංවර්ධනය සඳහා දායක විය හැකි ආකාරය පැහැදිලි කිරීම

- ව්‍යාපාර ආයතන ද තම ව්‍යාපාරය හා එහි පාර්ශවකරුවන් ගේ අවශ්‍යතා හා වුවමනා ලඟාකර ගැනීම සඳහා උපාය මාර්ග හා ක්‍රියාකාරකම් තේරීමේදී අනාගත අවශ්‍යතා සඳහා අවශ්‍ය වන මානව හා ස්වභාවික සම්පත් ආරක්ෂා කරමින් හා වැඩිදියුණු කරමින් කටයුතු කළ යුතුය එවිට එය තිරසර ව්‍යාපාර භාවිතයන් බවට පත්වේ.
- තිරසර සංවර්ධනය යථාර්ථයක් බවට පත් කර ගැනීම එක් ව්‍යාපාර ආයතනයකට පමණක් හුදකලාව කටයුතු කරමින් කළ නොහැකි වන අතර ඒ සඳහා පාරිභෝගියන් ද ඇතුළුව සමස්ත ලෝක ආර්ථික ප්‍රජාවම ක්‍රියාකාරීව දායක වියයුතු විශේෂයෙන්ම ව්‍යාපාර තිරසර සංවර්ධනයට දායක විය හැකි ආකාරය පහත ශ්‍රී යටතේ පෙන්නුම් කළ හැක.

## ආර්ථික තිරසර බව සඳහා ව්‍යාපාර වල දායකත්වය

ව්‍යාපාරයක් ආර්ථික තිරසර බව වෙනුවෙන් කටයුතු කරන විට අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි

1. ආර්ථික වර්ධනය හා ස්ථායිතාවය

2. කාර්යක්ෂමතාවය සම්පත් භාවිතය

3. තරගකාරීත්වය සාධාරණත්වය

4. නිෂ්පාදනය හා පරිභෝජනය

5. සේවා නියුක්තිය

6. අන්තර් ජාතික වෙළඳාම

ව්‍යාපාරයකට ආර්ථික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

1. සම්පත් කාර්යක්ෂමව භාවිතය

2. කුසලතා බලගැන්වීම

3. රැකියා නිර්මාණය

4. ප්‍රාග්ධනය කාර්යක්ෂමව භාවිත

5. අවදානම් කළමනාකරණය

6. ආර්ථික වර්ධනය බලගැන්වීම

7. පාර්ශවකරුවන්ගේ ප්‍රතිලාභ වර්ධනය

8. නවෝත්පාදන හඳුන්වාදීම

9. සේවක සුභසාධනය

10. තාක්ෂණය දියුණු කිරීම

## පාරිසරික තිරසර බව සඳහා ව්‍යාපාර වල දායකත්වය

පාරිසරික තිරසර සංවර්ධනය සාක්ෂාත් කර ගැනීමේ සඳහා ව්‍යාපාර කටයුතු කරන විට විශේෂ අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

1.

2.

3.

4.

ව්‍යාපාරයකට පාරිසරික තිරසර  බව තහවුරු කිරීමට කල හැකි ක්‍රියාකාරකම් කිහිපයකි .

■ පරිසර හිතකාමී හිතකාමී දෑ භාවිතා කිරීම

■ නිෂ්පාදන ක්‍රියාවලියේ දී අමුද්‍රව්‍ය බලශක්තිය වැනි දෑ සුරැකීම

■ අපද්‍රව්‍ය කළමනාකරණයේ දී 3ඝ , 4ඝ වැනි සංකල්ප භාවිතය

■ පරිසරයට හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිත

■ අන්තරාකාරී ද්‍රව්‍ය සුරක්ෂිතව භාවිත කිරීම

■ ජලය වාතය හා පස දූෂණය අඩු කිරීම

■ ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම

■ පාරිසරික නීතිරීති වලට අනුගතව කටයුතු කිරීම

■ සූර්ය ශක්තිය වැනි පරිසර හිතකාමී බලශක්ති භාවිතය

## සමාජ හා සංස්කෘතික තිරසර බව සඳහා ව්‍යාපාර වල දායකත්වය

ව්‍යාපාර ආයතන සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා කටයුතු කිරීමේදී අවධානය යොමු කළ යුතු කරුණු කිහිපයකි.

1. ජනතාවගේ ජීවන තත්වය උසස් කිරීම
2. ජනතාවට සමාන අවස්ථා සැපයීම
3. සමාජ ඒකාග්‍රතාව ඇති කිරීම
4. ජාත්‍යන්තර සහභාගීත්වය ලබා ගැනීම
5. මානව ප්‍රාග්ධනය නඩත්තු කිරීම
6. දේශීය සංස්කෘතිය සම්ප්‍රදායන් හා සිරිත් විරිත් ආරක්ෂා කිරීම
7. සංස්කෘතික පරිසරය සුරැකීම
8. දුගී බව අවම කිරීමට කටයුතු කිරීම
9. සේවක සබඳතා

ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා සඳහා ගත හැකි ක්‍රියාමාර්ග කිහිපයකි.

1. මානව විවිධත්වයට ගරු කරමින් කටයුතු කිරීම
2. මානව අයිතිවාසිකම් සුරැකීමට දායක වීම
3. සමානාත්මතාවයෙන් යුතුව කටයුතු කිරීම
4. අධ්‍යාපනය සෞඛ්‍ය ප්‍රවාහනය ආදී අත්‍යවශ්‍ය පහසුකම් සඳහා දායක වීම
5. සමාජ සංරක්ෂක කටයුතුවලට දායක වීම
6. සංස්කෘතික විවිධත්වයට ගරු කිරීම හා සුරැකීමට දායක වීම
7. නීතිය හා සාමය සුරැකීමට දායක වීම

## තිරසර සංවර්ධනය සඳහා ව්‍යාපාර වල නූතන නූතන භාවිතය තිරසර බව සඳහා වූ 4R සංකල්පය

නූතන සමාජයේ නිෂ්පාදන හා පරිභෝජන ක්‍රියාකාරකම් නිසා දිනකට දැරිය නොහැකි ප්‍රමාණයකින් අපද්‍රව්‍ය එකතු වීම ගෝලීය ප්‍රශ්නයක් බවට පත් වී ඇත එබැවින්

- නිශ්පාදනයේදී
- පරිභෝජනයේදී
- අපද්‍රව්‍ය කලමනාකරණයේ දී

4R සංකල්පය භාවිතය තුළින් තිරසාර සංවර්ධනයක් සාක්ෂාත් කර කරගැනීමට කර ගැනීමට උත්සාහ ගැනීම ලෝක මට්ටමින් අවධානය යොමුව ඇත.

## 4R සංකල්පයේ නියෝජනය

- Recycle -
- Reuse -
- Reduce -
- Replace -

ප්‍රතිචක්‍රියකරණය කිරීම ( Recycle )

අපද්‍රව්‍ය වෙන් කර වෙනත් භාණ්ඩයක් නිෂ්පාදනය කළ හැකි තත්ත්වයට පත්කිරීමයි

මෙහිදී ද්‍රව්‍ය වල පවතින භෞතික තත්ත්වය වෙනස් කිරීමට ලක් කෙරේ ලක් කෙරේ ප්‍රතිචක්‍රීයකරණය දෙයාකාරයක නිමැවුම් ලැබෙන සේ සිදු කළ හැකිය .

■ අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත බවට පත් කිරීම

( upcycle - අධි චක්‍රීය කරණය )

නිදසුන් -; පිදුරුවලින් කඩදාසි නිෂ්පාදනය කිරීම

■ ඉහළ වටිනාකමක් ඇති නිෂ්පාදිත අඩු වටිනාකමක් ඇති අමුද්‍රව්‍ය බවට පත් කිරීම

( low cycle - අව චක්‍රීය කරන )

නිදසුන් -: ජපානය භාවිතයෙන් ඉවත් කරන වාහන තලා යකඩ බවට පත් කිරීම .

නැවත නැවත භාවිතා කිරීම ( Reuse )

නිෂ්පාදන කාර්යයේදී නැවත භාවිතයට ගත හැකි දෑ යොදා ගැනීම

■ නිදසුන් -: කෑම ඔතන පොලිතීන් ෂීට් වෙනුවට කෑම පෙට්ටි භාවිතය

භාවිතය අඩු කිරීම ( reduce )

පරිසරයට මුදාහරින අපද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීම

නිෂ්පාදනය හෝ පරිභෝජනය සඳහා යොදා ගන්නා ද්‍රව්‍ය වලින් ඉවත ලන ද්‍රව්‍ය ප්‍රමාණය අඩු කිරීමෙන් මෙම කාර්යය පහසු වේ එසේ ම පරිසරයට අහිතකර දේ භාවිතයෙන් ඉවත් කිරීම භාවිතය ප්‍රතික්ෂේප කිරීම භාවිත නොකර සිටීම මඟින් ඊට දායක විය හැකිය.

■ නිදසුන් -: භාණ්ඩයක ඇසුරුම සඳහා දිරාපත් නොවන පොලිතින් භාවිත නොකර සිටීම

පානීය ජලය ප්ලාස්ටික් ඇසුරුම් වල නොදැමීම

නැවත ස්ථාපිත කිරීම ( Replace )

නිෂ්පාදන කටයුතු සඳහා භාවිතා කරන ස්වභාවික සම්පත් වලින් නැවත ස්ථාපිත කළ හැකි සම්පත් පරිසරය තුළ ස්ථාපිත කිරීම.

■ නිදසුන් -: වනයෙ දැව අමුද්‍රව්‍ය ලෙස භාවිතා කරන ආයතනයක් වන වගා ව්‍යාපෘතියක් ඇරඹීම

මසුන් මැරීමේ ආයතනයක් මසුන් බෝ කිරීම ව්‍යාපෘති ඇරඹීම

දිරා යන ද්‍රව්‍ය භාවිතය (Rot)

ස්වාභාවිකවම දිරාපත් වන ද්‍රව්‍ය නිෂ්පාදන හා පාරිභෝජන ක්‍රියාවලියේ දී භාවිතයට ගැනීම.

## ඉහත 1, 2, 3, 3R , පාරිභෝගිකයාට තිරසර සංවර්ධනයට දායක විය හැකි ආකාරය පැහැදිලි කිරීම

පරිසරයට අප එරෙහි වුවහොත් පරිසරය අපට එරෙහි වනු ඇත එබැවින් පරිසරය මිහිකත සුරැකීම අනෙකකුගේ නොව මාගේ වගකීම වන්නේය පාරිභෝගිකයකු වශයෙන් අපට ගත හැකි එවැනි ක්‍රියාමාර්ග රැසකි

- පරිසර හිතකාමී දේ මිලට ගැනීම
- අපද්‍රව්‍ය කළමනාකරණයේ දී 3ඝෘ , 4ඝෘ භාවිතය
- පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය

- අන්තරාකාරී ද්‍රව්‍ය ආරක්ෂිතව භාවිතා කිරීම
- පරිසර සංරක්ෂණය පරිසර හිතකාමී කටයුතු වල දී රජය හා රාජ්‍ය නොවන ආයතන සමග එක්ව කටයුතු කිරීම
- සූර්ය ශක්තිය වැනි පරිසර හිතකාමී බලශක්ති භාවිතය
- අවශ්‍ය පරිභෝජනයෙන් බැහැරවීම
- ඉන්ධන භාවිතය අවම කිරීම
- කෙටි දුර පයින් යාම
- රුක් රෝපණය
- අපද්‍රව්‍ය බැහැර කිරීම සඳහා විවිධ බහලුම් භාවිතා කිරීම

## ව්‍යාපාර කටයුතු වල අහිතකර බලපෑම්

1. පරිසර දූෂණය වන පරිදි අපද්‍රව්‍ය මුදා හැරීම
2. ස්වාභාවික ද්‍රව්‍ය අපතේ යන අයුරින් නිෂ්පාදනය කිරීම
3. සංස්කෘතියට නොගැලපෙන වෙළඳ දැන්වීම්
4. සංස්කෘතියට නොගැළපෙන ඇඳුම් නිර්මාණ
5. වැඩි ලාභ අපේක්ෂාවෙන් ගුණාත්වයෙන් අඩු භාණ්ඩ අපනයනය කිරීම
6. දැඩි තරගකාරිත්වය තුළින් පාරිභෝගියන් රැවටීම
7. සේවක සුබසාධනය පිළිබඳ නැඹුරු අඩුවීම
8. ව්‍යාපාර වලින් පිටවන අධික ඝෝෂාවන් නිසා ශබ්ද දූෂණය වීම
9. දිරා නොයන ඇසුරුම් වර්ග භාවිතා කිරීම
10. විදුලිය ජලය අපතේ යැවීම

## ව්‍යාපාර කටයුතුවල අහිතකර බලපෑම් අවම කිරීමට යෝජනා ඉදිරිපත් කිරීම

1. විදුලිය ඉන්ධන  අරපිරිමැස්මෙන් භාවිතයට යොමු කිරීම
2. රුක් රෝපණ වැඩසටහන් ක්‍රියාවට නැංවීමේ වැදගත්කම පැහැදිලි කිරීම
3. පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතයට යොමු කිරීම
4. අන්තරාකාරී ද්‍රව්‍ය සුරක්ෂිතව භාවිත කිරීමට යොමු කිරීම

5. පාරිසරික නීතිරීති වලට අනුගතව කටයුතු කිරීමට දැන්වීම

6. කර හිතකාමී ඇසුරුම් භාවිතය

7. අපද්‍රව්‍ය කළමනාකරණයේ දී 5සෘ සංකල්ප භාවිතා කිරීමට පුරුදු වීම

8. සූර්ය ශක්තිය වැනි පරිසර හිතකාමී බලශක්ති භාවිතයට නැඹුරු කිරීම

9. සංස්කෘතිය ආරක්ෂා වන පරිදි නිෂ්පාදන කටයුතු සිදු කිරීම

## ව්‍යාපාර ආචාරධර්ම

ව්‍යාපාරවල සාර්ථකත්වය සඳහා ආචාර ධර්ම පද්ධතියක අවශ්‍යතාව තහවුරු කිරීම

Learning outcomes

- ව්‍යාපාර ආචාර ධර්ම සංකල්පය පැහැදිලි කරයි
- ව්‍යාපාර වලින් සිදුවන හොඳ හා නරක දෑ සඳහා නිදසුන් ඉදිරිපත් කරයි
- ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ අවශ්‍යතාවය පෙන්වා දෙයි
- ව්‍යාපාර ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක ලැයිස්තුගත කරයි
- එකෙක් සාධකය සඳහා සුදුසු වන ව්‍යාපාර ආචාරධර්ම තම අත්දැකීම් ඇසුරෙන් යෝජනා කරයි
- පවත්නා ව්‍යාපාරයක් සැලකිල්ලට ගෙන එම ආයතනය පිළිබඳ ආචාර ධර්ම සාකච්ඡා කරයි
- උපකල්පනය කරන ලද ව්‍යාපාරික ට ගැලපෙන ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනගයි
- ව්‍යාපාර ආචාර ධර්ම හා සමාජයීය වගකීම් අතර වෙනස පැහැදිලි කරයි

හොඳ පුරවැසියකු වශයෙන් නිවසේ දී ආගමික ස්ථානයකදී සහ වෙනත් පොදු ස්ථාන කදී කළ යු දී කළ යුතු හා නොකළ යුතු දෑ පවතී එම ස්ථාන වලදී කළ යුතුදැයි මොනවාදැයි සඳහන් කරන්න

නිවසේ දී

- 
- 

ආගමික ස්ථානයකදී

- 

පොදු ස්ථානයකදී

- 
- 
- 

## ව්‍යාපාර ආචාර ධර්ම සංකල්පය පැහැදිලි කිරීම

ව්‍යාපාර ආචාරධර්ම හොඳ හා නරක පිළිබඳ වූ අදහසකි. මේ සඳහා පහත දැක්වෙන අර්ථකතන දිය හැක

……………………………………………………………………………………………………………………
……………………………………………………………………………………………………………………
…………………………………………………………………………'

නැතහොත්

හොඳ දේ කිරීමත් නරක දේ නො කිරීමත් ය

ව්‍යාපාර වලින් සිදුවන හොඳ හා නරක දෑ සඳහා නිදසුන් ඉදිරිපත් කිරීම

හොඳ ක්‍රියාවන්

1. ගුණාත්මක භාණ්ඩ විකිණීම
2. සාධාරණ මිල අය කිරීම
3. ආචාරශීලීත්වය
4. උපදෙස් සැපයීම
5. අනුග්‍රාහකත්වය සැපයීම්
6. සාධාරණ වැටුප් ගෙවීම
7. සමානාත්මතාවය සැලසීම

නරක ක්‍රියාවන්

1. අසත්‍ය ප්‍රචාරණය
2. පාරිභෝගිකයන්ට වැරදි අවබෝධ ලබාදීම

3. සංවිධානමය අපයෝජනය

4. වංචා සහගත ලෙස මුදල් හෝ තැන්පතු රැස් කිරීම

5. තරගය යටපත් කිරීම / තරඟ විරෝධි විරෝධී චර්යා

6. භාණ්ඩ බාල කිරීම හා පරිභෝජනයට නුසුදුසු දෑ මිශ්‍ර කිරීම

7. නිවැරදි කිරි කිරුම් මිනුම් භාවිත නොකිරීම

8. මිල වංචා

9. බදු වංචා

10. පරිසර දූෂණය

11. ශ්‍රම සූරාකෑම

## ව්‍යාපාර ආචාරධර්ම පිළිපැදීමේ අවශ්‍යතාවය පෙන්වාදීම

ව්‍යාපාර ආචාර ධර්ම පිළිපැදීම ව්‍යාපාර වලට වැදගත් වේ

1. ගුණාත්මක භාණ්ඩ හා සේවා සැපයීම තුළින් ගනුදෙනුකරුවන්ට සාධාරණයක් ඉටු වන අතර එමගින් ව්‍යාපාර වෙනුවෙන් ද ඔවුන්ගේ විශ්වාසය ඉහළ යයි

2. අලෙවිකරණයට අදාල ආචාර ධර්ම පිළිපැදීම තුළින් ව්‍යාපාරයේ පැවැත්ම තහවුරු වීම සහ තරගකාරීත්වයට සාර්ථක ලෙස මුහුණ දිය හැකි වීම

3. ගිණුම්කරණ කටයුතු වලට අදාල ආචාරධර්ම ආචාරධර්ම පිළිපැදීමෙන් ව්‍යාපාරය තුළ සිදුවිය හැකි මූල්‍ය අක්‍රමිකතා වංචා විෂමාචාර පිටු දැකීම තුළින් විශ්වාසය තහවුරු වීම

4. කීර්තිනාමය වැඩිවීම

5. සේව්‍ය සේවක අයිතීන් හා යුතුකම් සුරකින ආචාර ධර්ම තුළින් සේවකයින් ජාති කුල ආගම් හෝ ස්ත්‍රී පුරුෂ ආදී වශයෙන් සිදුවන අසාධාරණකම් සිදු නොවීමෙන් ජ්බී මනා මානව සම්පත් කළමනාකරණයක් සිදු වීම සේවකයින්ට සමානව සැලකීමට අවස්ථා ලැබීම

6. ආයතනයට සේවකයින් ආකර්ෂණය පහසු වීම හා සේවක ප්‍රවාසිතාව ශ්‍රම පිරිවැටුම අඩුවීම

## ව්‍යාපාර ආචාරධර්ම සංග්‍රහය පද්ධතිය

ආචාරධර්ම සංග්‍රහය යනු ,

- ව්‍යාපාරය සකස් කරන ලද ආචාරධර්ම ලිඛිතව දැක් වූ විට එය ආචාර ධර්ම සංග්‍රහය ලෙස හැඳින්වේ
- මේවා ව්‍යාපාරික හැසිරීම් පාලනය කරන නීති හෝ සම්මතයන්ය.

නිදසුන්

1. රාජ්‍ය සේවකයින් සඳහා - ආයතනික සංග්‍රහය
2. වරලත් ගණකාධිකාරීන් සඳහා - චාටර් පත්‍රය
3. වෛද්‍යවරුන් සඳහා - හිප්‍රොකොටිස් දිවුරුම
4. හෙදියන් සඳහා - නයිටිංගේල් දිවුරුම

ආචාර ධර්ම පද්ධතියෙන් ආවරණය වන පාර්ශව

සමහර ව්‍යාපාර ආයතන සිය ව්‍යාපාරයට අදාල ආචාරධර්ම ලිඛිතව ප්‍රකාශයට පත් කරයි එම ආචාර ධර්ම පද්ධතිය ආවරණය වන පාර්ශව කිහිපයකි.

- ගනුදෙනුකරුවන්
- සේවකයින්
- අයිතිකරුවන්
- ප්‍රජාව

සාමාන්‍යයෙන් අංක එකේ ආචාරධර්ම ලෙස සඳහන් කරනුයේ ගරු කිරීම යන්නයි අන්‍යයන්ට ගරු කිරීම සෑම පුද්ගලයෙකුගේම යුතුකමකි ආචාර ධර්මයකි.

## ව්‍යාපාර ආචාරධර්ම පද්ධතියක් ගොඩනැගීමේ දී සැලකිලිමත් විය යුතු සාධක ලයිස්තුගත කිරීම

1. ව්‍යාපාරය

ව්‍යාපාරයේ ස්වභාවය කුමක්ද භාණ්ඩ නිෂ්පාදන ව්‍යාපාරයක් ද සේවාවන් සපයන ව්‍යාපාරයක්ද කුඩා පරිමාණ ව්‍යාපාරයක් ද මහා පරිමාණ ව්‍යාපාරයක් ද ආදිය සැලකිල්ලට ගැනීම

2. ගනුදෙනුකරුවන්

ගණුදෙනුකරුවන්ගේ ඉල්ලුම් රටා, මිලදී ගැනීමේදී සැලකිලිමත් විය යුතු කරුණු සන්නිවේදනය, ආගමික සමාජ හා සංස්කෘතීන්ට අදාල කරුණු පිළිබඳව සැලකිලිමත් වීම

3. සේවකයෝ

සේවක චර්යාව සේවක විනය සේවක දායකත්වය කුමන මට්ටමේ සේවකයෙක් ද ඔවුන්ගේ පරිසරය අවශ්‍යතා හා වුවමනා පිළිබඳ සැලකිලිමත් වීම.

4. තරගකරුවෝ

තරගකරුවන් සිටිද තරගකාරීත්වය ප්‍රතිචාර උපායමාර්ග සම්බන්ධ ඔවුන් අනුගමනය කරන ආචාර ධර්ම මොනවාද යන්න පිළිබඳව සැලකිලිමත් වීම

5. සමාජ සංස්කෘතිය

ජන වර්ගය තුළ මුල් බැසගත් සංස්කෘතික සාරධර්ම හා අගනාකම් උප සංස්කෘතීන් ගැන සැලකිලිමත් වීම

6. සංවිධාන සංස්කෘතිය

ව්‍යාපාරය තුළ පවතින චාරිත්‍ර වාරිත්‍ර වටිනාකම් පුරුදු ආකල්ප යනාදිය පිළිබඳව සැලකිලිමත් වීම .

7. ප්‍රායෝගික වීම

ආචාරධර්ම පද්ධති සකස් කිරීමේදී එම ආචාරධර්ම ප්‍රායෝගිකව ක්‍රියාත්මක කිරීමට හැකියාව ඇත්ද යන්න පිළිබඳ සැලකිලිමත් වීම.

8. අයිතිකරුවන්

ගුණාත්වය හා ලාභය පිළිබඳ සමබරතාව ගොඩනැගීමට සම්බන්ධ ආචාර ධර්ම පිළිබඳ සැලකිලිමත් වීම

9. සැපයුම්කරුවන්

අමුද්‍රව්‍ය වල ගුණාත්වය තහවුරු කරගැනීමට අවශ්‍ය ආචාර ධර්ම පිළිබඳ සැලකිලිමත් වීම

10. කළමණාකරු

කළමනාකරුවන්ගේ දායකත්වය සැලසෙන පරිදි ආචාරධර්ම ගොඩනැගීම පිළිබඳ සැලකිලිමත් වීම

ආචාර ධර්ම පද්ධතියක් සැකසීමේ දී සැකසීමේදී සැලකිලිමත් විය යුතු සාධක

■

■

උපකල්පනය කරන ලද ව්‍යාපාරයකට ගැලපෙන ආචාර ධර්ම පද්ධතියක් ගොඩනැගීම

උපකල්පනය කරන ලද ව්‍යාපාරය -: තරිඳු පාමසිය

1.

2.

## ව්‍යාපාර ආචාරධර්ම ආචාර ධර්ම හා සමාජ වගකීම් අතර වෙනස පැහැදිලි කිරීම

■ ව්‍යාපාර තමන් සමග කටයුතු කරන සියලු පාර්ශවවලට යහපතක් සිදුවන ආකාරයට හොඳ නරක පිළිබඳ අවබෝධයෙන් කටයුතු කිරීම ව්‍යාපාර ආචාරධර්ම ලෙස හැඳින්වේ ව්‍යාපාරය හා සම්බන්ධ සියලුම උනන්දුවක් දක්වන පාර්ශවයන්ට උපරිම අයුරින් සාධාරණයක් ඉටු වන ආකාරයට කටයුතු කටයුතු කිරීම ව්‍යාපාර සමාජ වගකීමයි.

■ ව්‍යාපාර ආචාර ධර්ම හා පුළුල් සංකල්පය තුළ අඩංගු එක් අංශයක් ලෙස ව්‍යාපාර සමාජ වගකීම හැඳින්විය හැක

■ ආචාරධර්ම ව්‍යාපාරය විසින් රැකිය යුතු දෙයක් වන අතර සමාජ වගකීම ව්‍යාපාර විසින් වියදමක් දරා සමාජයට ආපසු ලබා දිය යුතුයි.

A/L NOTE BOOK

All about AL Notes ready for GCE AL Examination

# DOWNLOAD

Notes

Short Notes

Unit Test Papers

Term Test Papers

**From**

**www.ALNoteBook.com**

## Your Ultimate Resource for GCE A/L Notes and Study Guides

"The A/L notebook website is a dedicated online platform designed to provide comprehensive study materials and notes specifically tailored for students preparing for the General Certificate of Education Advanced Level (GCE A/L) examinations for free. The website offers a wide range of resources, including detailed subject notes, past exam papers, practice questions, and study guides. These materials cover various subjects and are curated by experienced educators to ensure they align with the curriculum and exam requirements."